# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/14 – 2014 ජූලි 30 වැනි බදාදා – 2014.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංක : DSB/LND/03/AQUIC/28.
ඉඩම් අංශයේ යොමු අංකය : එල්ඩී/05/2005/යූඩීජ්/107.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජයමහ හිටිහාමිලාගේ සුගත් පුෂ්පක ජයමහ වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වන්දි මුදල වන (රු. 1,81,126.10) එක්ලක්ෂ අසූඑක්දහස් එකසිය විසිහයයි ශත දහයක් සහ ඊට අදාල පොලී මුදල වන රුපියල් අසූහය දහස් තුන්සිය හැට එකයි ශත විසි හතක මුදල (රු. 86,361.27) ඉඩමේ හිමිකරුවන්ට ලබා ගැනීම සඳහා තංගල්ල දිසා අධිකරණයේ අංක LA 116 නඩු අංක යටතේ තංගල්ල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 1-0713-01-28791 දරන ගිණුමට බැර කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

ජේ. එච්. එස්. පී. ජයමහ,
ප්‍රාදේශීය ලේකම්.
බෙලිඅත්ත.

2014 ජූලි මස 25 වැනි දින.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පලපොත ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 306,309,310 හා 2007.02.27 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 261,205,213 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 137.33 ක් පමණ වූ යායවත්ත නමැති ඉඩම.

08 – 543

1A – G 019974 – 25 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*සැ.යු.– මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*